නීතිඥ සේනක පෙරේරා
සභාපති,
සිරකරු අයිතිවාසිකම් සුරකීමේ කමිටුව,
අංක 170,හල්ස්ඩ්‍රොප් වීදිය, කොළඹ 12
0714453890 / perera.senaka@gmail.com

සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,
අංක 14,
ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

**පැමිණිලි අංක HRC/1401/22,HRC/SUO/MOTU/07/22 සම්බන්ධයෙන් වැඩිදුර කරුණු පැහැදිලි කර ගැනීම.**

සිරකරු අයිතිවාසිකම් සුරකීමේ කමිටුවේ සභාපතිවරයා ලෙසින් කටයුතු කරන මා හට ඉහත පැමිණිල්ලේ විමර්ශන කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු පැහැදිලි කර ගැනීම අත්‍යාවශ්‍ය යැයි සිතමි.

01 ඉහත විමර්ශනය මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් වූ පැමිණිල්ලකට අදාල විමර්ශනයක් ද ? එසේ නැතහොත් මානව හිමිකම් කොමිසමේ suo moto විමර්ශනයක් ද ?

02 අප ඉහත කාරණය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති බැවින් මෙම විමර්ශන කටයුතු සඳහා අප සංවිධානය අදාල පාර්ශවයක් වූයේ කුමන පදනමින් ද ?

03 මෙතෙක් පැවැති විමර්ශන කටයුතු වලදී මෙය අප සංවිධායට එරෙහි විමර්ශනයක් බවට හැඟී ගිය බැවින්, මානව හිමිකම් කොමිෂන් සභාව මේ වන විට පෞද්ගලික පාර්ශවයන්ට එරෙහිව මෙවැනි විමර්ශන කටයුතු ආරම්භ කර තිබේ ද ? අප සංවිධානයට එරෙහිව එවැනි පැමිණිල්ලක් තිබේද ?

04 මානව හිමිකම් කොමිසම පෞද්ගලික පාර්ශවයන් මේ අකාරයෙන් කැඳවා විමර්ශන සිදුකරන්නේ නම් ඉදිරියේදී මේ හා සමාන පැමිණිලි වලදී අපට මෙසේ පෞද්ගලික පාර්ශවයන් ඉදිරිපත් කිරීමට හැකියාව පවතී ද ?

05 මෙම විමර්ශනය සඳහා සිරකරු අයිතිවාසිකම් සුරකීමේ කමිටුවේ සභාපති වශයෙන් මා කැඳවා මෙවැනි පරීක්ෂණයක් සම්බන්ධයෙන් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව දිවුරුම් පිට සාක්ෂි ලබා ගැනීමක් සිදු කලේ කුමන පදනමකින් ද ? යම් හෙයකින් එය suo moto පරීක්ෂණයක් නම් එවැනි අවස්තාවක ප්‍රශ්න අසමින් දිවුරුම් මත ප්‍රකාශ සටහන් කර ගැනීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ කුමන වගන්තියකට අනුව සිදු කලේද ?

06 මෙම විමර්ශන කටයුතු සඳහා ජනාධිපති නීතිඥ ඊරන්ත වලලියද්ද මහතා තොරාගත් පදනම කුමක් ද ? සහ එය සිදුකලේ පනතේ කුමන වගන්තිය මතද ?

මෙම ප්‍රශ්නගත සිදුවීම සම්බන්ධයෙන් ඉදිරියේ දී සිදුකරන පරීක්ෂණවලට සහයෝගය දැක්වීමේ පදනමින් මෙම කරුණු දැන ගැනීමට මා බලාපොරොත්තු වන අතර ම ශ්‍රී ලංකා පුරවැසියන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට බැඳී සිටින ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් මේ පිළිබඳව ඔබ දරන ස්ථාවරය පොදු මහජන වැදගත් කමකින් යුක්ත බැවින් ඔබගේ පැහැදිලි කිරීම අපෙක්ෂා කරමි. තවද ඔබගේ ස්ථාවරය ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් අවධානයට යොමු කිරීමට මා අදහස් කර සිටිමි.

ස්තුතියි,
මෙයට

නීතිඥ සේනක පෙරේරා
2022.05.27